# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2144/60 - 2019 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2019.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/73 (xii)

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියමය

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මා විසින්, මේ නියමය මඟින් ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති භූමි ප්‍රදේශය අභය භූමියක් ලෙසට ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඒ අභය භූමිය ''මහා රාවණා හා කුඩා රාවණා සමුද්‍රීය අභය භූමිය'' ලෙස හඳුන්වනු ලැබිය යුතු බවට මෙම නියමය මඟින් තවදුරටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

කොළඹ දීය.

**උපලේඛනය**

***මහා රාවණා හා කුඩා රාවණා සමුද්‍රීය අභය භූමිය සමන්විත භූමි ප්‍රදේශයේ සීමාවන්***

දකුණු පළාතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ ද මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:50,000 සිතියම් පරිමාණයට අනුකූල වන පරිදි SLD 99 ඛණ්ඩාංක පද්ධතියෙන් ලබා ගත් පහත සඳහන් GPS ඛණ්ඩාංක වලින් මායිම් වූ හෙක්ටයාර් 67282.3 ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය :-

*උතුරු මායිම* : යාල ජාතික උද්‍යානයේ දකුණු වෙරළේ පලටුපාන කලපුවෙහි පිහිටි ඛණ්ඩාංක නැ.119894 උ.271528 වන ආරම්භක ලක්ෂ්‍යයේ සිට යාල ජාතික උද්‍යානයේ වෙරළ තීරයෙහි උපරිම වඩදිය මට්ටම ඔස්සේ ඊසාන දෙසට ගමන් කිරීමේ දී කි. මී. 55.77 ක් දුරින් වෙරළ තීරයෙහි පිහිටි ඛණ්ඩාංක නැ.144898 උ.302813 වන ලක්ෂ්‍යය දක්වා ද වේ ;


*නැගෙනහිර මායිම* : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට සෘජු සරළ රේඛාවක් ඔස්සේ ගිණිකොණ දෙසින් මුහුදේ පිහිටි ඛණ්ඩාංක නැ.142503 උ.304841 නැ.140723 උ.306348 නැ.139013 උ.307797 නැ.137228 උ.309542 නැ.134677 උ.311779 සිට උතුරු මායිමේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කි.මී. 15.9 ක් දුරින් මුහුදේ පිහිටි ඛණ්ඩාංක නැ.132999 උ.313357 වන ලක්ෂ්‍යය දක්වා ද වේ ;



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දකුණු මායිම් : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට නිරිත දෙසට මුහුදේ ගමන් කිරීමේ දී නිරිත දෙසට වන්නට මුහුදේ පිහිටි බණ්ඩාංක නැ.131432 උ.311228 නැ.129917 උ.309169 නැ.128450 උ.307175 නැ.126894 උ.305061 නැ. 125577 උ.303271 නැ.124283 උ.301512 නැ.122679 උ.299333 නැ.120989 උ.297037 නැ.119467 උ.294969 නැ. 118128 උ.293149 නැ.116484 උ.290915 නැ.114999 උ.288891 නැ.113168 උ.286408 නැ.111423 උ.284038 නැ.110015 උ.282124 නැ.107866 උ.279203 දක්වා ද එතැන් සිට බටහිර දෙසින් මුහුදේ පිහිටි බණ්ඩාංක නැ.107309 උ.276235 නැ.106674 උ.272846 නැ.106142 උ.270007 නැ.105538 උ.266788 නැ.104905 උ.263415 නැ.104164 උ.259460 දක්වා ද නැගෙනහිර මායිමේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කි.මී. 64.8 ක් දුරින් පිහිටි බණ්ඩාංක නැ.103727 උ.257133 වන අවසන් ලක්ෂ්‍යය දක්වා ද වේ.

බස්නාහිර මායිම : අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට උතුරු දෙසට ඍජු සරල රේඛාවක් ඔස්සේ කි.මී. 1.8 ක් දුරින් මුහුදේ පිහිටි බණ්ඩාංක නැ.105531 උ.257079 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට නැගෙනහිර දෙසට වන්නට මුහුදේ පිහිටි බණ්ඩාංක නැ.105864 උ.259086 නැ.106214 උ.261192 නැ.107951 උ.271667 දක්වා ද එම ලක්ෂ්‍යයේ සිට ඍජු සරළ රේඛාවක් ඔස්සේ උතුරු දෙසින් පිහිටි බණ්ඩාංක නැ.110313 උ.271648 නැ.113122 උ.271626 නැ.116007 උ.271603 නැ.118430 උ.271601 දක්වා ද එතැන් සිට යාල ජාතික උද්‍යානයේ වෙරළ තීරයේ වඩදිය මට්ටමේ පිහිටි නැ.142503 උ.304841 වන ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ. (බස්නාහිර මායිමේ ආරම්භක ලක්ෂ්‍යයේ සිට ආරම්භක ලක්ෂ්‍යය දක්වා ඇති සියලුම බණ්ඩාංක කි.මී. 26.7 ක් තුළ පිහිටා ඇත.)






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.